# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## බෞද්ධ ශිෂ්ටාචාරය - 12 ශ්‍රේණිය


සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

**තිළිණ ජයවර්ධන** - ර/මල්වල මහා විද්‍යාලය


### 6 වන සතිය

**01.** මගධ ජනපදයෙහි බුද්ධ කාලීන පාලකයා ..................... රජතුමායි.

**02.** කාලාශෝක රජුගේ අනුග්‍රහයෙන් සිදු කළේ ..................... සංගායනාව යි.

**03.** කරවටක් ජලයේ බැස පව් සේදීම .................... නම් විය.

**04.** කුස තුළ සිටින දරුවා පිරිමි දරුවෙකු වේවායි බ්‍රාහ්මණයන් කළ ආගමික චාරිත්‍රය ...................... නම් වේ.

**05.** මිගාර මාතා ලෙස ප්‍රකට වූයේ .................. නම් සිටුවරිය යි.

**06.** දෙවන ධර්ම සංඝායනාවෙන් දස වස්තුව අකැප යැයි තීරණය කළහ. (...)

**07.** සංඝ සාමග්‍රිය භික්ෂු සමාජයේ දක්නට ලැබෙන පරමා දර්ශී ලක්ෂණයකි. (...)

**08.** නාලන්දා විශ්ව විද්‍යාලයේ සංස්කෘතික භාෂාව අනිවාර්ය වීය. (...)

**09.** බුදු රදුන් වැඩිම වස්කාලයක් පූර්වාරාමයේ වැඩ සිටියහ. (...)

**10.** දේවදත්ත තෙරුන් සෝවාන් බවට පත්විය. (...)

**11.** සුභද්‍ර තෙරුන්ගේ අභද්‍රවචනය අසා ...................... පමණ භික්ෂූන් කම්පා විය.

**12.** අස්සජි පුණබ්බසුබ යන භික්ෂූන් ..................... දෙනමට බැනවැදුණි.

**13.** මගධයට දැවැදි ලෙස ...................... ජනපදය ලැබුණි

**14.** වින්ධ්‍යා කඳු වැටිය නිසා දෙකට බෙදී තිබුණේ ...................... ජනපදය යි.

**15.** මගධයෙහි ආදිම අගනුවර ..................................... වේ.

**16.** වලභි විශ්ව විද්‍යාලය ඉදිකරන ලද්දේ .............................. පරපුරේ රජවරු විසිනි.

**17.** කෝසල රාජ්‍යයෙහි දෙව්රම් වෙහෙර පිහිටා තිබුණි. (...)

**18.** පළමු සංගීතිය සඳහා භික්ෂූන් 800 ක් සහභාගීවිය. (...)

**19.** චණ්ඩපජ්ජෝත රජතුමා මගධයෙහි පාලකයා විය. (...)

**20.** අජාසත්ත රජතුමා යොදුනෙන් යොදුන ආරාම කරවීය. (...)

**21.** බ්‍රහ්මජාල සාමඤ්ඤඵල සූත්‍ර .................................. නිකායට ඇතුලත් වේ.

**22.** ජෛනමහා වීරතුමා .................... නුවර දී අභාවප්‍රාප්ත වීය.

**23.** වස් විසීම කළ යුත්තේ .................... පොහොය දිනයේදී ය.

**24.** පළමු සංඝායනාවෙන් පසුව ............................ තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය පැනවීය.

**25.** පළමු ධර්ම සංගීතිය .................................... ලෙස හඳුන්වයි.

**26.** ගෘහස්ථ ආශ්‍රමයෙහි කාර්යය ඉගෙනීම යි. (...)

**27.** අන්තඃපුර ස්ත්‍රීන් 1500 කොසාල් රජුට විය. (...)

**28.** දස අකැප වස්තුවට වජ්ජිපුත්තක භික්ෂූන් පක්ෂ විය. (...)

**29.** මගධයට දැවැදි ලෙස කාසි ජනපදය ලැබුණි. (...)

**30.** විශාකාවන් දෙව්රම් වෙහෙර කරවීය. (...)

**31.** වික්‍රමශිලා විශ්ව විද්‍යාලය ඉදි කලේ .......................................... තෙරුන්ගේ උපදෙස් අනුවයි.

**32.** වජ්ජිපුත්තක භික්ෂූන් විසින් උක්ඛේපනීය කර්මයෙන් දඬුවම් කලේ ....................................... භික්ෂුවකටය.

**33.** බුදුරදුන්ගේ පද්මාචාර ජීවිතය බුදුරදුන් හා .................................. අතර සාකච්ඡාවෙන් පැහැදිලි වේ.

**34.** දෙවන අශෝක ලෙස ධපානයේ හඳුන්වන්නේ ............................. වේ.

**35.** කොන්ෆියුසියස්ගේ දහම පැවතියේ ........................ තුළයි.

**36.** අධිශීලයට පත්වීම ............................. හඳුන්වනු ලැබේ.

**37.** පළමු ධර්ම සංඝායනාව .................... ගුහාවෙහි පැවැත්වීය.

**38.** බුද්ධ ප්‍රතිමාවේ ශාක්‍ය සිංහ ලීලාව ................................ සම්ප්‍රදායේ දක්නට ලැබේ.

**39.** සප්ත්‍යසතිකා ලෙස .................... ධර්ම සංඝායනාව හඳුන්වයි.

**40.** රාජ්‍ය පාලනය ක්‍ෂත්‍රියන්ට හිමි ප්‍රධාන කාර්යය යි. (...)

**41.** සාවිත්‍රි ලෝපමුද්‍ර ආදීන් මුල් වෛදික යුගයේ සිටි ඍෂිවරියන් විය. (...)

**42.** ධර්ම සංගායනා සම්බන්ධ පැරණිම මූලාශ්‍රය මහා වංශයයි. (...)

**43.** දෙවන ධර්ම සංගීතියට දස අකැප වස්තුව මුල් විය. (...)

**44.** කොසොල් රජතුමා අයදෘෂමහා දාන පිරිනමන ලදී. (...)

**45.** බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 පසුව තෙවන සංගීතිය පැවැත් විය. (...)

**46.** අනේපිඩු සිටුතුමා මරණින් මතු දෙව්ලොව දිව්‍ය පුත්‍රයෙක්ව ඉපදුණි. (...)

**47.** පළමු සංගායනාව පුරා මාස 9 ක් තිස්සේ පැවැත් විය. (...)

**48.** දන් පිළිගැනීම ක්‍ෂත්‍රියන්ට හිමි කාර්යයකි. (...)

**49.** ගෘහස්ථ ආශ්‍රමයෙහි ඉගෙනීම කළ යුතු ය. (...)

**50.** ශුද්‍රයන් සතු එකම කාර්යය රාජ්‍ය පාලනය යි. (...)

**51.** දරුවන් තම මවුපියන්ට යුතුකම් 10 ඉටු කළ යුතුය. (...)

**52.** බුදුරදුන්ට අසදිසමහාදාන දෙන ලද්දේ කොසොල් රජතුමායි. (...)

**53.** සාම්ප්‍රදායික පාලි මූලාශ්‍රවලට අනුව ප්‍රථම ධර්ම සංගීතියට තුඩුදුන් මූලික හේතුව සුභද්‍රගේ අභද්‍ර වචන යි. (...)

**54.** බිම්බිසාර රජුගෙන් පසුව මගධයේ පීතෘ ඝාතකයන් රජවිය. (...)

**55.** කෝසලයෙහි අගනුවර රජගහ නුවර යි. (...)